මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| චිත්‍ර කලාව | 9 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..................................................................................................................................

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

**පහත දැක්වෙන රූප සටහන ආශ්‍රයෙන් අංක 01 සිට 05 දක්වා හිස්තැන් පුරවන්න.**



ඉහත රූප සටහනින් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ කලාත්මක මුරගල වන අනුරාධපුර 1) .................................. මුරගලයි. 2) ............................................... මාධ්‍ය භාවිතා කොට 3) ......................................... උන්නත ශිල්ප ක්‍රමයට නෙළා ඇත. මෙහි දක්නට ඇති රුව 4) ................................................ රුව ලෙස හැඳින්වේ. මුරගලින් 5) ................................................. සංකේතවත් වන බව ප්‍රකාශිතය.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(06)වෙස් මුහුණු වර්ණ ගැන්වීමේ දී සාම්ප්‍රදායික ශිල්පීන් අතීතයේ දී කහ වර්ණය සඳහා යොදාගත් ද්‍රව්‍ය මොනවාද? ...........................................................................


(07)ශෛලීගත නාට්‍ය වර්ගයට අයත් වේදිකා නාට්‍යයක් නම් කරන්න.............................................................

(08)පොළොන්නරු යුගයට අයත් හොඳම වටදාගෙය දැකියහැකි වන්නේ කුමන ස්ථානයේ ද? .....................................................................

(09)ශ්‍රී ලංකාවේ විශිෂ්ඨ කැටයම් සහිත පියගැට පෙළ නිර්මාණය සඳහා භාවිතා කර ඇති මාධ්‍යය කුමක්ද? ...................................................................................

(10) ශ්‍රී ලංකාවේ පවත්නා උඩරට නර්ථන සම්ප්‍රදාය හා බැඳුණු ශාන්ති කර්මය කුමක්ද? ..................................

- **පහත රූප සටහන ආධාර කරගෙන ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**



(11) ඉහත රූපයෙන් දක්වෙන්නේ කුමක්ද? ...................................................................................

(12) මෙය නෙලා ඇති මාධ්‍ය නම් කරන්න. ...................................................................................

(13) මෙහි මධ්‍යයේ නෙලා ඇති අඩ නෙළුමින් සංකේතවත් වන්නේ කුමක්ද? ....................................................

(14) මහනුවර යුගය වන විට මෙහි හැඩයේ සිදු වූ වෙනස කුමක්ද? ..............................................................

(15) මෙම නිර්මාණය හඳුන්වන වෙනත් නම් මොනවාද? ....................................................................................

- **අංක 16 සිට 20 තෙක් දී ඇති වචනයට ගැලපෙන වචනය තෝරා තිත් ඉර මත ලියන්න.**

(අල්ලියාදු ගෑම, කිරි හිඳවීම, පායම් පෑහීම, සණ කැපීම, ලකුණු කැපීම)

(16) ලී කඳන් කපා පොතු ගසා කැබලිවලට කපා ගැනීම ........................................................ නම් වේ.

(17) ලී කොටසේ ගැට සහිත තැන් කපා පැතලි හැඩයක් කර ගැනීම ....................................... නම් වේ.

(18)කදුරු ලීය පදම් කර ගැනීම සඳහා දුමේ දමා හෝ අව්වේ දමා වියලා ගැනීම .................................. නම් වේ.

(19) මුහුණේ ඇස් නාසය වැනි සියුම් අංග මතු කිරීම ..................................................... නම් වේ.

(20) වෙස් මුහුණු වර්ණ කිරීමට ප්‍රථම එහි තවරනු ලබන සුදු පැහැති මූලික ආලේපනය.......................... නම් වේ.

- **අංක 21 සිට 25 තෙක් දී ඇති වචනයට වඩාත්ම ගැලපෙන වචනය තෝරා තිත් ඉර මත ලියන්න.**

(21) ලාක්ෂා කර්මාන්තය සඳහා බෙහෙවින් ප්‍රසිද්ධ ප්‍රදේශය වන්නේ,

1) කෑගල්ල 2) මාතර 3) හපුවිද 4) දුම්බර

(22) ශ්‍රී ලංකාවේ කෝවිල් ආශ්‍රිතව නිර්මාණය ඇති මරවාහනම් අතර මිනිසුන් විසින් ඔසවාගෙන යන වාහන කාණ්ඩයට අයත් නොවන්නේ,

1) සිම්ම (සිංහ) වාහනම් 2) කෛලාස වාහනම්

3) කුදිරෙයි (අශ්ව) වාහනම් 4) මයිල් (මොනර) වහනම්

(23) අනුරාධපුර, පොළොන්නරු යුගවල දී කොරවක්ගල නිර්මාණය සඳහා එක් වූ සංකල්පය වන්නේ,

1) සිංහ සංකල්පය
2) මකර සංකල්පය
3) ගජසිංහ සංකල්පය
4) ඇත් සංකල්පය

(24) පාරම්පරික සිංහල සැරසිලි මෝස්තර අතරින් ඉර හා හඳ අයත් වන්නේ කුමන කොටසට ද?

1) දිව්‍ය ගණයට
2) සත්ත්ව ගණයට
3) උද්භිද ගණයට
4) නිර්ජීවි ගණයට

(25) නිල් සහ කහ වර්ණය එකතු වීමෙන් සෑදෙන වර්ණය වන්නේ,

1) රතු වර්ණය
2) දම් වර්ණය
3) කොළ වර්ණය
4) තැඹිලි වර්ණය

- **අංක 26 සිට 30 දක්වා දී ඇති වචන භාවිතා කරමින් චිත්‍ර කලාවට අදාළ වාක්‍යය ලියන්න. (ලකුණු 2 බැගින් ලබාදෙන්න)**

(26) සාදිලිංගම් ..........................................................................................................................

..........................................................................................................................

(27)වක දෙක ..........................................................................................................................

..........................................................................................................................

(28) ත්‍රිමාණ ලක්ෂණ ..........................................................................................................................

..........................................................................................................................

(29)කෛලාස වාහනම් ..........................................................................................................................

..........................................................................................................................

(30) නා රජරුව ..........................................................................................................................

..........................................................................................................................

- **අංක 30 සිට 35 දකවා දී ඇති වාක්‍ය සඳහා හරිනම් (✓) වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

(31) ශ්‍රී ලංකාවේ කෝවිල් ආශ්‍රිතව ඇති මරවාහනම් පැරණි හින්දු කැටයම් සම්ප්‍රදායන් නියෝජනය කරන අතර ශිවම් (ශිව දෙවි) සඳහා වූ තේර් රථය පැරණිම රථය ලෙස සැලකේ. ( )

(32)අනුරාධපුර යුගයට අයත් හොඳම වාහල්කඩ මිහින්තලයේ කණ්ඨක චෛත්‍ය වාහල්කඩයි. ( )

(33)නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී යනුවෙන් ප්‍රධාන නාට්‍ය වර්ග 02කි. ඒ අතුරින් ශෛලීගත නාට්‍ය අයත් වන්නේ ලෝක ධර්මී ගණයටය. ( )

(34)මූර්ති නිර්මාණයේ දී වඩාත් පහසුවෙන් හැසිරවිය හැකි මාධ්‍යයක් වන්නේ සෘජුෆෝම්ය. ( )

(35)සරල අච්චු මුද්‍රණ නිර්මාණයේ දී බණ්ඩක්කා, හබරළපිති ආදිය යොදා ගත හැකිය. ( )

## II කොටස

- **ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.**
- **ඔබේ නම සහ ප්‍රශ්න අංකය චිත්‍රයේ පසුපිටේ ලියන්න.**
- **ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකිය. ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.**
- **පහත අ, ආ, සහ ඉ කොටස් වලින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.**

**අ කොටස - ප්‍රකාශන චිත්‍ර**

(01)ආගමික ස්ථානයක බැතිබර අවස්ථාවක්.

(02) විලක් වෙත දිය වීමට පැමිණි වන සතුන්.

(03) මහා මාර්ගයක වැඩෙහි යෙදී සිටින කම්කරුවන්.

**ආ කොටස - මෝස්තර**

(04) ස්වාභාවිකව දැකිය හැකි මල් සහ කොළ ආශ්‍රයෙන් නිර්මාණාත්මක හැඩතල යොදාගෙන වර්ණවත් චීත්ත රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක්.

(05)සාම්ප්‍රදායික සත්ත්ව සැරසිලි යොදා ගනිමින් ලීයෙන් තැනූ දොරකට සුදුසු නිර්මාණයක් ඇඳ වර්ණ කරන්න.

(06)විසංගත වර්ණ භාවිතා කරමින් කුඩ රෙද්දකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.

**ඉ කොටස - ග්‍රැෆික් චිත්‍ර**

(07)'වන සම්පත සුරකිමු' යන මැයෙන් පෝස්ටර් චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.